


සිසිර දිසානායක

මීට වසරකට පමණ පෙර මෙල්බර්න් නුවර ප්‍රසංගයක් සඳහා පැමිණි මව් බිමේ ගායන ශිල්පියෙකු සමඟ "ගී සඳළුව" වෙනුවෙන් කළ සාකච්ඡාවක් මේ වනතුරුම පමා වීමට හේතුව වූයේ ඊට සුදුසුම අවස්ථාව එළඹෙන තුරු බලා සිටීමයි.
මව් බිමට කීර්තියක් ද ගෙන එමින් එහි වඩාත් ජනප්‍රිය ක්‍රීඩාව බවට පත් වී ඇති ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් නිර්මාණය වූ ගීයක් පිළිබඳවය ඉහත කී ජනප්‍රිය ජනප්‍රිය ගායන ශිල්පියා අප සමඟ සාකච්ඡාවට එක් වූයේ. ලෝක ක්‍රිකට් කුසලානය සඳහා මව්බිම ඇතුළු රටවල් 14ක් තරඟ වදිනා මේ අවස්ථාවේ එම සාකච්ඡාව පාඨකයින් වෙත ලියා තැබීම වඩාත් උචිත වැව් හඟින්නෙමු. ක්‍රිකට් ක්‍රීඩාව ඇසුරින් ලොව නන් රටවල්වලින් බිහිවන ගී අසන්නට ලැබෙනා මේ කාලයේදී මෙම ගීය අපට විශේෂයක් වන්නේ ක්‍රීඩාව මව් බිමේ ප්‍රචලිත වන මුල් යුගයේදීම ගැයුණු සිංහල ගීයක් වීමයි. සමන් ද සිල්වා ජනප්‍රිය ගායනා ශිල්පියා ගැයූ -තණ නිල්ල දිගේ" ගීයයි ඒ. -ගී සඳළුව" වෙනුවෙන් අප හා එක් වූ සමන් ද සිල්වා;

"මේ ගීතය එක් වුණේ අපේ රටට ටෙස්ට් වරම් ලැබුණු වෙලාවේ ක්ලැරන්ස් විජේවර්ධන මහත්මයා කරපු සංගත තැටියකට. ඔහුම ලියලා ඔහුම සංගීතය කරලයි මට මේ ගීතය කරලා දුන්-න්. මේ ගීයට දර්ශන ගත කිරීමකුත් කළා. සින්දු කියන ගායකයෙක් ක්‍රිකට් සෙල්ලම් කරන දර්ශන ඇතුලත් වුණා. මම යි ඒ විදියට මේ ගීතය ගයමින් ක්‍රීඩා කළේ ඒ දර්ශන වෙනුවෙන්."

"ඒ වගේ ම මේක ලෝකේ පළවෙනි ක්‍රිකට් සින්දුව මේ සින්දුව වෙන්න පුළුවන්. මේ ගීතය කෙරුනේ 1985 දී. ඒ දවස්වල රූපවාහිනියෙ තිබුණා තරගයක් -හද බැඳි ගී" කියලා. ඒ වසරේ වැඩිපුර වැඩසටහන් ජනප්‍රියම සින්දුව වුණේ මේ සින්දුව."
මම කලින් වැඩ කළේ මැණික් සංස්ථාවෙ. පස්සෙ මම ඒකෙන් අස්වෙලා සංගීත කණ්ඩායමක් කළා "සමන් ඇන්ඩ් ද ක්ලෑන්ස්" කියලා. ඊට පස්සේ - සියැක් " කියන වාදක මණ්ඩලයත් මම ගත්තා. ඉතින් ඒ කටයුතු තාමත් කරගෙන යනවා. කාලෙකින් අලුත් දෙයක් නම් කළේ නෑ."

"මගේ පුතාට මම ගීතයක් කළා. ඔහු නාලන්ද විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමේ කඩුළු රකින්නා. එයා ඒ පැත්තට යොමු කරවනවා. එයා මගේ විදියට ගායනා කරන කෙනෙක් නෙවෙයි. ඒත් එක්ක වෙනත් විදිහෙ ගීත එකතුවන් කරන්න බලාපොරොත්තුවක් තියෙනවා. දැන් ඉතින් අවුරුදු තිහක් - තිස්පහක් සින්දු කිව්වනේ. ඊට වඩා වෙනස් විදිහේ සින්දු එකතුවක් කරන්න ඕන කියලා හිතුවා."

# තණ නිල්ල දිගේ



තණ නිල්ල දිගේ
ඇදිලා යනවා
සිත මා - පිරිලා
දහසක් නෙත් මා වෙත යොමු
වෙනවා
සිත මා - පිරිලා

සැඩ හිරු මුදෙ ගිලෙනා
සෝ බර මේ සැඳෑවේ
හසරැල් නැගේ
සතුටින් වගේ
ජය ගීතිකා ගැයිලා

විදුලිය වාගේ ඇදිලා
යන විට ඈත නොපෙනී
දෙසවන් මගේ පිරිලා ඇතී
ජය ගීතිකා ගැයිලා

"ඔය අතරේ මට හොඳ අවස්ථාවක් ලැබුණා ලයනල් රන්වල ශූරින්ගේ -අහසේ ඉන්නවලු" කියන ගීතයට යුග ගායනයෙන් එතුමන්ට දායක වෙන්න. තවත් ගීත දෙකතුනක් නිර්මාණය කරලා දුන්නත් අපේ අවාසනාවට එතුමා අපට නැති වුණා."

සමන් එවකට ගායක ගායිකා සංගමයේ සභාපතිවරයායි. යුධ ගිනි දැල් ඇවිලෙමින් තිබුණ කාලයේ ගායක ගායිකාවන් ඇතුළු ක්ෂේත්‍රයේ අයට එය බල පෑ අන්දමත්, ඉදිරියට වඩාත් සුභදායී ආකාරයට ඒ දේවල් විසඳාගන්නා අන්දමත් සමන් දිගින් දිගට කතා කළා.

"විදේශ සංචාර කරගෙන තමයි පහුගිය කාලේ අපි ජීවත් වුණේ. ඉදිරියට හොඳවෙයි කියලා අපි හිතනවා. ඉතින් ඒ එන හැටියට හෙමින් හෙමින් අපි අපේ ගමන යනවා." සමන් සිල්වා ගායන ශිල්පියා පිළිසඳර නිමා කළා.
කොළඹ නාලන්ද විද්‍යාලයේ ආදි-ශිෂ්‍යයෙකු වූ සමන් ද සිල්වා ශිල්පියා ආනන්ද - නාලන්ද මහා ක්‍රිකට් තරඟය පසුබිම් කරගනිමින් මේ ගීය සඳහා කර දර්ශන පෙළ අපේ සිහියට නැංවුණා. මේ සුහද පිළිසඳර නිමාවේ -ගී සඳළුව" පාඨකයින් වෙනුවෙන් අප ඔහුට ස්තූතිවන්ත වුණා.




# තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

ඉර එළිය රූස්ස ගස් අතරින් මහ පොළොවට එබිකම් කරන්න පටන් අරගෙන. ඒ සතුටටද කොහේද කුරුළු රංචු හතරවටින්ම කෑ ගහන්න පටන් අරන්. ඉරමුසු පානයක රස බලමින් කොයින් මාමා සමග රට රැම තොරතුරු කතා කරමින් හිටිය මට හේන් යායේ හිතවත් කොල්ලන් කෙල්ලන් වැට ළඟට ඇවිදින් කතා කරනවා.

"අපි බැද්දෙ රිංගනවා.. අල බිදින්ට මනාප නම් වරෙන්.. බොට හැකි රිස්ස යනකන් ගඩා ගෙඩි ගිලින්ට.."

අවසරයක් බලාපොරොත්තුවෙන් මම කොයින් මාමා දිහා බලනකොට උන්දෑ මෙහෙම හරුපයක් කියාපි.

"අකුල් තැලුවට මොකෑ පැල් ගැහෙන්ට කාරි නෑ ඕන්.."

"කියන හරුපයක් තේරුම් ගන්ට කියාපන් මාමා"

"මේ අහ.. මේකේ එකීලත් එක්ක වන වැදුනට මොකද උන් ගම රට නොගෙනියා.." එහෙම කියලා පිලට ගොඩ උනේ මේ කවියත් කියලා.

ගොඩැල්ලේ තරම දැනගෙන ලිඳ කපනු
බොරුල්ලේ තරම දැනගෙන උඩ පනිනු
කඩුල්ලේ තරම දැනගෙන වැට බඳිනු
තමුන්ගේ තරම දැනගෙන කල් හරිනු

බෝගල

GATEWAY
LAWYERS

▶ Advice on Legal Matters
▶ Business & Commercial Law
▶ Sale of Business
▶ Conveyancing
▶ Powers of Attorney
▶ Wills & Estate Planning
▶ Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia

Bring your Nephew/Niece/Brother or Sister to
STUDY IN AUSTRALIA
Chisholm INTERNATIONAL
STUDY IN CHISHOLM INSTITUTE, MELBOURNE
* ELICOS
* Diploma & Advanced diploma
* University transfer
Courses offer:
Accounting, Air-conditioning, Architecture, Business, Bakery, Beauty, Biotechnology, Building design, Cookery, Dental technology, Engineering, Electronics, Graphic Prepress, Hairdressing, Information Technology, Nursing,...etc
For Total Free Visa Processing
Approved agent for Chisholm Institute
SHEFFIELD EDUCATION CONSULTANCY
SHEFFIELD EDUCATION CONSULTANCY
QEAC
Qualified Education Agent Counsellor
Australia:
74 Stud Road, Dandenong, VIC3175.
Tel/Fax: +61 387075627, 0425663222
Sri Lanka:
91/4 Maharagama RD Piliyandala
Tel:+94 11 2616125
0777 838403
1/1 Trinity Gardens Pallekelle, Kundasale, Kandy
Tel:+94 812420418
0777 802065
FLEX Graphic
Email : Sheffield.officers@gmail.com | Web : www.sheffieldeducation.com

